**ඉන්දියානු මහ කොමසාරිස්තුමා BIDTI හි රාජ්‍යතාන්ත්‍රිකභාවය හා ලෝක සබඳතා පිළිබඳ 21 වන ඩිප්ලෝමා පාඨමාලාව සමාරම්භ කිරීම**

**විශ්වාසයෙන්, සැවොම එක්ව ප්‍රගතිය කරා**

ශ්‍රී ලංකාවේ ඉන්දියානු මහ කොමසාරිස් තරංජිත් සිං සන්ධු මැතිතුමා අද දින කොළඹ බණ්ඩාරනායක ජාත්‍යන්තර රාජ්‍යතාන්ත්‍රික පුහුණු ආයතනයෙහි (BIDTI) රාජ්‍යතාන්ත්‍රිකභාවය හා ලෝක සබඳතා පිළිබඳ 21 වන ඩිප්ලෝමා පාඨමාලාව සමාරම්භ කළේය. BIDTI හි අධ්‍යක්ෂ ජනරාල්, තානාපතිනි පැමලා ඩීන් මහත්මිය, ශ්‍රී ලංකා විදේශ කටයුතු අමාත්‍යංශයේ නැගෙනහිර ආසියාව, අග්නිදිග ආසියාව හා ඕෂනියා අංශයේ අධ්‍යක්ෂ ජනරාල්, දමයන්ති රාජපක්ෂ මහත්මිය, පීඨ සාමාජිකයන් සහ BIDTI හි ශිෂ්‍ය ශිෂ්‍යාවන්ද මෙම අවස්ථාවට සහභාගී වූහ. මෙය නරේන්ද්‍ර මෝදි මැතිතුමා ඉන්දියාවේ අග්‍රාමාත්‍යවරයා ලෙස නැවත වතාවක් තේරී පත්වීමෙන් අනතුරුව මහ කොමසාරිස්තුමා විසින් සිදු කරන ලද පළමු ප්‍රසිද්ධ දේශනයයි. මහ කොමසාරිස්තුමා ඉන්දියාවේ විදේශ ප්‍රතිපත්තිය පිළිබඳව අදහස් දැක්වූ අතර ජාතික ආරක්ෂාව පිළිබඳ විශේෂයෙන්ම සඳහන් කළේය. එසේම ඉන්දියා - ශ්‍රී ලංකා ද්විපාර්ශවීය සම්බන්ධතාවයේ විවිධ පැතිකඩ පිළිබඳවද එතුමා අදහස් දැක්වීය. මහ කොමසාරිස්තුමා පහත කරුණු පිළිබඳවද සිය දේශනයේදී සඳහන් කළේය.

- අග්‍රාමාත්‍ය මෝදි මැතිතුමා ශ්‍රී ලංකා ජනාධිපතිතුමාගේ ආරාධනයකට අනුව මෙම සති අන්තයේදී ශ්‍රී ලංකාවට පැමිණීමට නියමිතය. මෙය අග්‍රාමාත්‍ය ධූරයට නැවතත් තේරී පත්වීමෙන් අනතුරුව මෝදි මැතිතුමා විසින් සිදු කරන පළමු විදෙස් සංචාරයේ කොටසකි. අපේ්‍රල් 21 වන දින ප්‍රහාරයෙන් පසු ඇති වූ තත්වයේදී ඉන්දීය ජනතාව ශ්‍රී ලාංකේය ජනතාව සමඟ සිටින බවට වන පණිවිඩය එතුමාගේ සංචාරයෙන් ලබා දෙනු ඇත.
- ත්‍රස්තවාදය සහ අන්තවාදය මනුෂ්‍යත්වයට තර්ජනයකි. මෑතකදී ශ්‍රී ලංකාවේ සිදුවූ ප්‍රහාර ශ්‍රී ලංකාවට පමණක් එල්ල වූ ප්‍රහාර නොවේ. ලොව කොතැනක හෝ සිදුවන ත්‍රස්තවාදය සමස්ත මනුෂ්‍යත්වයේම හෘද සාක්ෂියට එල්ල වන ප්‍රහාරයකි. අප සියලු දෙනාම එකය යන මානුෂීය චින්තනයට එය ප්‍රහාර එල්ල කරයි. කලාපීය ආරක්ෂාවට සහ ලෝක සාමයට තර්ජනයක් වන එදිරිවාදී ජිහාඩ් මතවාදය හුදෙකලා කළ යුතු අතර එය මුලිනුපුටා දැමිය යුතුය. අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි මැතිතුමා මෙ සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවට අවශ්‍ය ඕනෑම සහයෝගයක් ලබා දීමට කැමැත්ත පළ කර තිබේ.
- දිවුරුම් දීමෙ උත්සවයෙන් අනතුරුව පළමු දිනයේදී අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි මැතිතුමා ශ්‍රී ලංකාව ඇතුළු අසල්වාසී රාජ්‍යයන්ගේ නායකයන් හමු වීමට යොදා ගෙන තිබිණ. මෙයින් පිළිඹිබු වන්නේ ඉන්දියාව සිය අසල්වැසි රාජ්‍යයන් සමග තිබෙන විශේෂ සම්බන්ධතාවයන්ට ලබා දෙන වැදගත්කමයි.

- ඉන්දියාව සෑම විටම ශ්‍රී ලංකාවේ අවශ්‍යතා සහ ප්‍රමුඛතා සඳහා ප්‍රථමයෙන් ප්‍රතිචාර දක්වන රාජ්‍යයක් වේ. ගංවතුර හෝ නියඟ තත්වයකදී මිනිස් ශ්‍රමය හා සහනාධාර සමඟ ප්‍රතිචාර දක්වන ප්‍රථමයා ඉන්දියාව වේ. ඉන්දියාව විසින් දිවයින පුරා විවිධ ජනතා කේන්ද්‍රීය සංවර්ධන ව්‍යාපෘති රැසක් සම්පූර්ණ කර ඇති අතර ඒවා පූර්ණ වශයෙන්ම ජනතාවට ලබා දුන් ප්‍රදාන වේ.
- පසුගිය වසර පහක කාලය තුළ ඉන්දියා-ශ්‍රී ලංකා සබඳතාවල සුවිශේෂී වෙනස්කම් දක්නට ලැබිණ. 2015 මාර්තු මාසයේ දී අග්‍රමාත්‍ය මෝදි මැතිතුමාගේ ශ්‍රී ලංකා සංචාරය ඉන්දියාවේ අග්‍රාමාත්‍යවරයෙකු විසින් වසර 28කට පසුව ප්‍රථම වරට මෙරට කරන ලද සංචාරයයි. 2017 මැයි මාසයේ පවත්වන ලද ජාත්‍යන්තර වෙසක් දින සැමරුම් උත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගී වීමටද අග්‍රමාත්‍ය මෝදි මැතිතුමා මෙරටට පැමිණියේය. ඉන්දියාවේ මෑතකදී පවත්වන ලද මැතිවරණයේදී අග්‍රාමාත්‍ය මෝදි මැතිතුමා සඳහා ලබාදුන් තීරණාත්මක ජනවරම තුළින් එතුමාගේ ආණ්ඩුවේ ප්‍රතිපත්ති අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා ලබාදුන් සහයෝගය පිළිබිඹු වේ. මෙම ප්‍රතිපත්ති අඛණ්ඩව සහ තවදුරටත් ශක්තිමත් කිරීම ශ්‍රී ලංකාවටද හිතකර වේ.
- ඉන්දියානු විදේශ ප්‍රතිපත්තියේ මූලික අරමුණ වන්නේ බිලියන 1.3ක ජනතාවගේ සුරක්ෂිතභාවය තහවුරු කිරීම සහ ඔවුන්ගේ සැබෑ සංවර්ධන අපේක්ෂාවන් ඉටු කරදීමයි. ඉන්දියාව සිය අරමුණු සාක්ෂාත් කරගැනීමේදී තම අවශ්‍යතා මත පමණක් කටයුතු නොකරයි.

ඉන්දියාව සැම විටම සංවර්ධනයේ ප්‍රතිලාභ බෙදාහදා ගැනීම පිළිබඳව විශ්වාස කරයි. එක්ව දියුණුව කරා පියනැගීම ඉන්දීය විදේශ ප්‍රතිපත්තියේ මූලික හරය වේ. අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි මැතිතුමා පවසා ඇති පරිදි ඉන්දියාව කලාපයේ සැමට ආරක්ෂාව හා සංවර්ධනය සහිත අනාගතයක් ඉන්දියානු සාගරය සඳහා අපේක්ෂා කරයි.

- කලාපය හා ලෝකය කැලඹීමට ලක්වුවහොත්, තනි තනි රටවලට සාමකාමී, සුරක්ෂිත හා සමෘද්ධිමත් විය නොහැක. අද පවතින්නේ අතිශයින්ම එකිනෙකා හා සම්බන්ධ වූ ලෝකයකි. අන් අයගේ කරදර සහ ගැටළු ඔහුට හෝ ඇයට පමණක් තිබෙන ප්‍රශ්නයක් ලෙස සැලකිය නොහැක. එය ඔවුන්ට තරමටම අපටද දැනෙන ප්‍රශ්නයකි. ලෝක සාමය හා සමස්ත ස්ථාවරත්වය පවත්වාගෙන යාම සඳහා අපගේ පෞද්ගලික සහ සාමූහික උනන්දුව අවශ්‍ය වේ.
- අන්තර්ජාලය හා සයිබර් අවකාශය අප සිතන හා ක්‍රියාකරන ආකාරය විප්ලවයකට ලක් කර තිබේ. ඩිජිටල් යුගය, තාක්ෂණය සහ සමාජ මාධ්‍ය විසින් මානව වර්ගයා එක තැනකට ගෙනවිත් ඇති අතරම එය ප්‍රචණ්ඩත්වය හා නොඉවසීම පැතිර විය හැකි අවියක් වී ඇත.
- මෙහිදී පුද්ගලයන් සිටින සැබෑ ස්ථානයෙන් ඔබ්බට අදහස් සහ මතවාදයන් දේශසීමා ඉක්මවා යමින් ගමන් කරයි.
- පිටස්තරභාවය, වර්ගීකරණය සහ අනන්‍යතා ධ්‍රැවලින් වෛරය සහ ප්‍රචණ්ඩත්වය නිර්මාණය වීම සඳහා සුදුසු වටපිටාවක් සකසයි.

ආදරය සහ ඉවසීම එකමුතුභාවය තුළ පමණක් තිබිය හැකි ගුණාංග වේ. ඉන්දියාව විශ්වාස කරන්නේ සංවර්ධනය කරා යන ගමනේදී සියලු දෙනාවම රැගෙන යා යුතු බවයි. බහුවිධභාවය සැමරිය යුතු කරුණක් විනා සටන් කළ යුතු කරුණක් නොවේ.

- මහ කොමසාරිස්තුමා මෙම අවස්ථාවේදී පොත් බෙදා දීමක්ද සිදු කළේය.

කොළඹ

2019 ජූනි 07